# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 39 දරන
# අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 නොවැම්බර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක**

**මිල : ශත 75 යි.** තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ 70/88

**ඉන්දීය සම්භවය ඇති ඇතැම් අදේශිකයන්ට ශ්‍රී ලංකා පුරවැසි තත්ත්වය ප්‍රදානය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

1986 අංක 5 දරන අදේශිකයන්ට පුරවැසි භාවය ප්‍රදානය කිරීමේ පනතේ පූර්විකාවෙන්, ඒ පනත පනවනු ලැබූ දින සිට මාස හයේ සිට අට දක්වා වූ කාලය ඇතුළත, ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටින ඉන්දීය සම්භවය ඇති තැනැත්තන් 506,000 කට ඉන්දියානු පුරවැසිභාවය ප්‍රදානය කිරීමට ඉන්දීය ආණ්ඩුව එකඟ වී ඇති බව ප්‍රකාශ වන හෙයින් ද :

ඒ තැනැත්තන් අතුරෙන් ඉන්දියානු පුරවැසිභාවය ප්‍රදානය කරන ලෙස ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලුම් කළ තැනැත්තන් 422,000 කට ඉන්දියා ආණ්ඩුව විසින් ඉන්දියානු පුරවැසිභාවය මේ වන විට ප්‍රදානය කර ඇති හෙයින් සහ ඉතිරි තැනැත්තන් 84,000 ට ඉන්දියානු පුරවැසිභාවය ප්‍රදානය කොට ඔවුන් ඉන්දියාවට පෙරළා යැවීම පිළිගනු ඇති හෙයින් ද :

1986 අංක 5 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත යටතේ ඉන්දීය සම්භවය ඇති තැනැත්තන් 469,000 කට සහ ශ්‍රී ලංකාවේ ශේෂ වන ඉන්දීය සම්භවය ඇති යම් අදේශික තැනැත්තන්ට ද පුරවැසිභාවය ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුව බැඳී සිටින හෙයින් ද :

ශ්‍රී ලංකා ආණ්ඩුව මේ දක්වා ඉන්දීය සම්භවය ඇති තැනැත්තන් 236,000 කට ශ්‍රී ලංකා පුරවැසිභාවය ප්‍රදානය කර ඇති හෙයින් සහ ඉතිරි අයට පුරවැසිභාවය ප්‍රදානය කිරීමට බැඳී සිටින හෙයින් ද :

එකී පනත පනවනු ලැබූ දින සිට මාස දහඅටක් ඇතුළත දී අදේශිකයන් පිළිබඳ ප්‍රශ්නය විසඳීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව තීරණය කර ඇති බව එකී පනතින් පෙනී යන හෙයින් ද :

බලාපොරොත්තු නොවූ විවිධ අවස්ථාගත කරුණු හේතුකොට ගෙන එකී බැඳීම් ඉහත කී කාලසීමාව ඇතුළත සපුරා ලීමට නොහැකි වූ හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසි භාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2—ඩී 001747—7,740 (88/10)

ඇතැම් අදේශික තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීම.

2. වෙනත් යම් නීතියක කවර විධිවිධානයක් තිබුණ ද—

(අ) ඉන්දීය සම්භවය ඇත්තා වූ ද නිත්‍යානුකූලව ශ්‍රී ලංකාවේ වාසිකව සිටින්නා වූ ද,

(ආ) අදේශිකයන් වන්නා වූ ද,

(ඇ) 1986 අංක 5 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනතේ සඳහන් වන්නා වූ ද ඉන්දියානු පුරවැසිභාවය ප්‍රදානය කරන ලෙස ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලුම් කර ඇත්තා වූ ද 506,000 ක් තැනැත්තන් අතරට සහ 1964 ඔක්තෝබර් මස 30 වන දිනට පසුව ඔවුන්ට උපන් දරුවන් අතරට ඇතුළත් නොවන්නා වූ ද

සෑම තැනැත්තකුට ම, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකාවේ පුරවැසි තත්ත්වය හිමිවන අතර ඔවුන්ට ශ්‍රී ලංකාවේ වෙනත් පුරවැසියන්ට නීතිය අනුව හිමිකම ඇති සියලු අයිතිවාසිකම්වලට සහ වරප්‍රසාදවලට හිමිකම තිබිය යුතු ය.

මේ පනත යටතේ පුරවැසි භාවය ලබන තැනැත්තන්ගේ තත්ත්වය.

3. (1) 2 වන වගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන සෑම තැනැත්තෙක් ම—

(අ) ශ්‍රී ලංකා පුරවැසිභාවය අහිමිවීමේ හෝ අහිමි කිරීමේ සහ පුරවැසිභාවය අත් හැරීමේ වගකීමට අදාළ වන නීතියේ විධිවිධාන ඇතුළුව, නීතිය අනුව ශ්‍රී ලංකා පුරවැසියන් යටත් වන බැඳීම්වලට ම සහ වගකීම්වලට ම ශ්‍රී ලංකාවේ වෙනත් පුරවැසියන් හා සමාන ආකාරයෙන් සහ ඒ හා සමාන ප්‍රමාණයට යටත් වන්නේ ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ මව්පියන්ගේ, මුතුන් මිත්තන්ගේ හෝ ස්වාමි පුරුෂයාගේ සම්භවය ඇති වූ දේශයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ ඒ තැනැත්තාට තිබෙන්නට ඇති නැතහොත් මේ පනත නිසා නොවේ නම් ඒ තැනැත්තාට තිබිය හැකි වූ සිවිල් සහ දේශපාලන තත්ත්වය සම්බන්ධයෙන් වූ සියලු අයිතිවාසිකම් අත් හරිනු ලැබූ ලෙස නීතියෙහි ලා සලකනු ලැබිය යුතු ය; තවද

(ඇ) තත්ත්වයට, පුද්ගල අයිතිවාසිකම්වලට හා යුතුකම්වලට සහ ශ්‍රී ලංකාවේ දේපළවලට අදාළ හෝ ඊට සම්බන්ධ සියලු කාරණාවල දී ශ්‍රී ලංකාවේ නීතිවලට යටත් විය යුතු ය.

පුරවැසිභාවය පිළිබඳ සහතිකය.

4. (1) මේ පනතේ 2 වන වගන්තිය හේතු කොටගෙන ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් තැනැත්තකුට, ඔහු කැමතිනම්, මේ පනතේ 'අ' උපලේඛනයේ දැක්වෙන ආකෘතියට සාරානුකූලව, පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් සඳහා කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කළ හැකි අතර කොමසාරිස්වරයා විසින්, තමා වෙත ඒ ඉල්ලුම් පත්‍රය ලැබී දවස් හැටක් ඇතුළත, මේ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සහතිකයක් නිකුත් කළ යුතු ය. ඒ සහතිකය මේ පනතේ 'ආ' උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(2) එවැනි ඉල්ලුම්පත්‍රයක් මේ පනතේ 'අ' උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත කළ ප්‍රකාශයක් සමග ඉදිරිපත් කළ යුතු ය.

(3) 1964 ඔක්තෝබර් මස 30 වන දිනට පෙර ඉපදුණු තැනැත්තන් සම්බන්ධයෙන් වන විට, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ දී 1967 අංක 14 දරන ඉන්දු—ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනත යටතේ සහතික පත්‍ර නිකුත් කරනු නොලැබූ තැනැත්තන් 469,000 ක ශේෂය සම්බන්ධයෙන් පමණක් මේ පනත යටතේ සහතික නිකුත් කිරීමට කොමසාරිස්වරයාට බලය ලැබිය යුතු ය. මේ සංඛ්‍යාව ඉක්මවා යම් තැනැත්තකුට (1) වන උපවගන්තිය යටතේ සහතිකයක් නිකුත් කිරීම සඳහා ඔහු විසින් අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ලබාගත යුතු ය.

(4) යම් කාර්යයක් සඳහා (1) වන උපවගන්තියේ සඳහන් සහතිකයක් ඉදිරිපත් කරන ලෙස කිසිම තැනැත්තකු විසින් නියම නොකළ යුතු අතර එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයක් බැලූ බැල්මට පිළිගැනෙන සාක්ෂියක් වශයෙන් භාරගත යුතු ය.

වැරදි.

5. 4 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක සඳහන් කිරීමට නියමිත යම් විස්තරයක් අසත්‍ය බව දැන දැනම එය ඇතුළත් ප්‍රකාශයක් කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු විය යුතු අතර ලඝු නඩු විභාගයකින් පසුව මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. තවද ඒ ප්‍රකාශයේ ඇති එම අසත්‍ය සඳහන් කිරීම නිසා නොවේ නම් එම ප්‍රකාශය මත විශ්වාසය තබා නිකුත් කරන ලද සහතිකය නිකුත් නොකරන්නට තිබූ බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ සහතිකය අවලංගු කෙරෙන ආඥාවක් කළ යුතු ය.

අර්ථ නිරූපනය.

6. මේ පනතෙහි—

"කොමසාරිස්වරයා" යන්නෙන්, 1967 අංක 14 දරන ඉන්දු—ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනත යටතේ පත් කරන ලද, ඉන්දියානු සම්භවයක් ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා අදහස් වේ,

3—ඩී 001747—(88/10)

## 'අ' උපලේඛනය

(4 වන වගන්තිය)

**1. 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ** විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් **සඳහා ඉල්ලුම් කිරීම,**

.................................... වන මම, 1988 අංක 39 දරන අදේශිකයන්ට **පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය** යටතේ පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කර සිටිමි.

2. මා ඉන්දියානු සම්භවයක් ඇති ශ්‍රී ලංකාවෙහි නීත්‍යානුකූලව වාසය කරන තැනැත්තකු බවත් ඉන්දියානු පුරවැසිභාවය ලබා ගැනීම සඳහා මා කවර හෝ **අවස්ථාවක ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය වෙත ඉල්ලුම් කර නැති** බවත් 1986 අංක 5 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනතේ සඳහන් කරන ලද 506,000 තැනැත්තන්ගේ වර්ගයට හෝ ඔවුන්ගේ දරුවන්ට මා අයත් නොවන බවත් ප්‍රකාශ කර සිටිමි.

3. 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ **විධිවිධාන) පනතේ 5 වන වගන්තියේ සඳහන් කර ඇති වරදවල් සහ දණ්ඩන** ගැන මම සම්පූර්ණයෙන් ම දනිමි.

4. ඉල්ලුම් කර ඇති පුරවැසිභාවය පිළිබඳ සහතිකය නිකුත් කිරීමට හැකිවනු **පිණිස මට අදාලවන විස්තර මෙහි යට දක්වමි.**

5. විස්තර :

(1) **සම්පූර්ණ නම සහ වෙනත් නම් :**—————.
(පැහැදිලි අකුරින්)

(2) **පියාගේ නම :**—————.

(3) **මවගේ නම :**—————.

(4) **ස්ත්‍රී/පුරුෂ භාවය :**—————.

(5) **හැඳුනුම්පත් අංකය (ඇත්නම්) :**—————.

(6) **පදිංචි ලිපිනය :**—————.

(7) **වෘත්තිය සහ වෘත්තිය කරන ස්ථානයේ ලිපිනය :**—————.

(8) **උපන් දිනය :**—————.
**(උපන් දිනය සඳහන් කර නොමැත්තේ නම් ආසන්න වර්ෂය සඳහන් කරන්න)**

(9) උපන් ස්ථානය :—————.
(ශ්‍රී ලංකාවෙන් පිටත උත්පත්තිය සිදුවී ඇත්නම් ශ්‍රී ලංකාවට පළමු වෙන් පැමිණි දිනය සඳහන් කරන්න.)

(10) **සිවිල් තත්ත්වය :**—————.
**(විවාහක/අවිවාහක/වැන්දඹු/දික්කසාද/වෙන් වී ජීවත්වන)**

(11) **කලත්‍රයාගේ සම්පූර්ණ නම :**—————.

(12) ශ්‍රී ලංකාවෙහි උත්පත්තිය නොලැබුවේ නම් පසුගිය අවුරුදු විස්ස කාලය තුළ පදිංචි ස්ථානවල සහ සේවානියුක්ති/වෘත්තිය කරන ලද ස්ථානවල ලිපිනයන් :————.

(13) ඉන්දු-ලංකා ගිවිසුම යටතේ ශ්‍රී ලංකා පුරවැසිභාවය සඳහා ඉල්ලුම් කර ඇත්තේ නම්, ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ ලිපිනය සහ ඊට දී ඇති යොමු අංකය (ඇත්නම්) සඳහන් කරන්න :————.

**ප්‍රකාශය**

මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති ඉහත දැක්වෙන විස්තර සත්‍ය බව මම ගාම්භීරතා පූර්වකව ද ඍාදයංගමව ද සත්‍ය ලෙස ද සහතික කොට/දිවුරා ප්‍රකාශ කරන අතර, ඒවා සත්‍ය බව හෘදය සාක්ෂියට අනුව විශ්වාස කරමින් මෙම ප්‍රකාශය කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන හෝ
මාපට'ඟිලි සලකුණ.

දිනය :————.

19................ මස ............... දින .............. දී මා ඉදිරිපිට දී සහතික කොට ප්‍රකාශ කරන ලදී/දිවුරා ප්‍රකාශ කරන ලදී.

————,
සමාදාන විනිශ්චයකාරවරයාගේ හෝ
දිවුරුම් කොමසාරිස්වරයාගේ අත්සන.

සමාදාන විනිශ්චයකාරවරයාගේ හෝ
දිවුරුම් කොමසාරිස්වරයාගේ
නම :————.

**‘ආ’ උපලේඛනය** (4 වන වගන්තිය)

අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත

1988 අංක          දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා පුරවැසිභාවය පිළිබඳ සහතිකය :

එකී පනතේ 4 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි, පුරවැසිභාවය පිළිබඳ සහතිකයක් ලබාගැනීම සඳහා, ඉන්දිය සම්භවය ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා වෙත.........විසින් (ඔහු/ඇය) සම්බන්ධයෙන් යයි කියනු ලබන පහත දැක්වෙන විස්තර ඉදිරිපත් කරමින් යථා පරිදි ඉල්ලුම් කර ඇති හෙයින් :

එකී 4 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව, ඉන්දිය සම්භවය ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා වන ........................ එකී .......................................... එකී 2 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා පුරවැසියකු බව සහතික කරයි.

මේ බව පිළිගනිමින් සාක්ෂි වශයෙන් මගේ අත්සන තබමි.

..........................................................................

ඉන්දිය සම්භවය ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා

දිනය :————.

ඉන්දිය සම්භවය ඇති තැනැත්තන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

• **ඉල්ලුම්කරු පිළිබඳ විස්තර**

නම :———.

පියාගේ නම :———.

ලිපිනය :———.

ජාතිය හෝ රත්භාව :———.

උපන් ස්ථානය සහ දිනය :———.

ස්ත්‍රී පුරුෂ භාවය :———.

හැඳුනුම් පත් අංකය :———.

භාර්යාවගේ / ස්වාමිපුරුෂයාගේ නම :———.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.